**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ
**ප්‍රවෘත්ති නිවේදනය**
මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපෑල: angelicab@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20220606

**තෙල් ඉහිරීම් සඳහා ප්‍රතිචාර දක්වන්නට ශ්‍රී ලංකාවට උදවු කිරීම සඳහා එක්සත් ජනපදයෙන් වැඩමුළුවක් සංවිධානය කෙරේ**

එක්සත් ජනපදය, ශ්‍රී ලංකා නාවික හමුදාවේත්, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේත්, පරිසර සංරක්ෂණය සහ ආපදා ප්‍රතිචාර සඳහා වගකියන තවත් ශ්‍රී ලාංකික ආයතන දොළහකත් සම්බන්ධීකරණය ඇතිව, තෙල් ඉහිරුම් සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා එ.ජ. අරමුදල් යොදවා සිදුකළ වැඩමුළුවක් සහ අභ්‍යාසයක් ජූනි මස 6වැනි දින පවත්වන ලදී.

මෙම පස් දින වැඩමුළුවේ අරමුණ වන්නේ තෙල් ඉහිරීම් සහ අනෙකුත් සමුද්‍රීය හදිසි අනතුරුවලදී ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව ශක්තිමත් කිරීමයි. මුහුදේ සිදුවන ආපදාවලට ඉක්මනින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන්නේ කෙසේද, තෙල් ඉහිරීමකින් සිදුවන පාරිසරික හානිය මනින්නේ සහ අවම කරගන්නේ කෙසේද, සහ ආපදා ප්‍රතිචාර මෙහෙයුම්වලදී පළමු ප්‍රතිචාර දක්වන්නන් ආරක්ෂිතව තබා ගන්නේ කෙසේද යන්න පිළිබඳ පුහුණු කිරීම් එයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති ජුලී චංග් මහත්මිය “ඊයේ දිනයේ දී අපි ලෝක පරිසර දිනය සැමරුවා, මේ වැඩමුළුව ශ්‍රී ලංකාවේ පාරිසරික සංරක්ෂණය වෙනුවෙන් අපගේ අඛණ්ඩ කැපවීම පෙන්නුම්කරන උදාහරණ අතරින් එකක් පමණයි. රජයේ සහ සිවිල් සමාජයේ අපගේ ශ්‍රී ලාංකික හවුල්කරුවන් සමගින් සමීපයෙන් වැඩ කිරීමෙන්, සමුද්‍රීය පරිසර පද්ධති පිවිතුරුව පවත්වාගෙන යෑම සඳහා ඔවුන්ට අවශ්‍ය කරන සම්පත් සහ කුසලතා දේශීය සංවිධානවලට ලබාදී ශ්‍රී ලංකාවේ ආපදා ප්‍රතිචාර හැකියාවත් පාරිසරික කළමනාකරණ ධාරිතාවත් ශක්තිමත් කරන්නට අපි අපේක්ෂා කරනවා.”

මෙම වැඩමුළුව, ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම පාරිසරික ව්‍යසනයන්ගෙන් එකක් වන 2021 මැයි මාසයේ දී ඇති වූ එක්ස්ප්‍රෙස් පර්ල් ගින්නට ප්‍රතිචාර වශයෙන් එක්සත් ජනපද අරමුදල් සහිතව සංවිධානය කරන ලද පුහුණුවකට අමතරව ව සංවිධානය කරන ලද්දකි. තෙල් ඉහිරීම් සඳහා ප්‍රතිචාර දැක්වීම යනු මෙම වැඩමුළුව සඳහා අරමුදල් සපයන U.S. Indo-Pacific Command හි පාරිසරික ආරක්ෂණ වැඩසටහනේ එක් අංශයක් පමණි. නීතිවිරෝධී මසුන් ඇල්ලීම අවම කිරීම, වෙරළ කලාප කළමනාකරණය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය වැනි විශේෂඥ දැනුම ඇති අනෙකුත් ක්ෂේත්‍ර ද ඊට ඇතුළත් වේ.